# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2339/10 - 2023 ජූලි මස 04 වැනි අඟහරුවාදා - 2023.07.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 16/2014

**2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත**

2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ 86 (2) (උ) වන වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**කංචන විජේසේකර,**
විදුලිබල හා බලශක්ති අමාත්‍ය.

2022 නොවැම්බර් මස 25 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග ''නිෂ්පාදනය කිරීම, භාවිතය හෝ ගබඩා කිරීම අතරතුර විකිරණශීලී ප්‍රභවයන්ගේ සුරක්ෂිතතා'' නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2022.12.01 දිනයේ සිට බලාත්මකභාවයට පත්විය යුතු ය.

2. මේ නියෝග මගින් විකිරණශීලී ප්‍රභවයන්ගේ සුරක්ෂිතතාව සඳහා වන මූලික නියම නිශ්චිතව දක්වනු ලැබේ.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. විකිරණශීලි ප්‍රභවයක් ද්වේෂ සහගත ක්‍රියාවක දී භාවිත කරන්නේ නම් විය හැකි හානිය මත පදනම්ව. විකිරණශීලි ප්‍රභවයක් හෝ විකිරණශීලි ප්‍රභවයන්ගේ එකතුව මෙහි I වන උපලේඛනයේ I වන වගුවේ නිශ්චිතව දක්වා ඇති පරිදි සුරක්ෂිතතා මට්ටමකට වෙන් කරනු ලැබිය යුතුය. :-

(අ) 1 වන වර්ගයේ විකිරණශීලි ප්‍රභව සඳහා ''අ'' වන සුරක්ෂිතතා මට්ටම වෙන් කරනු ලැබේ ;

(ආ 2 වන වර්ගයේ විකිරණශීලි ප්‍රභව සඳහා ''ආ'' වන සුරක්ෂිතතා මට්ටම වෙන් කරනු ලැබේ ;

(ඇ) 3 වන වර්ගයේ විකිරණශීලි ප්‍රභව සඳහා ''ඇ'' වන සුරක්ෂිතතා මට්ටම වෙන් කරනු ලැබේ.

4. මෙහි I වන උපලේඛනයේ II වන හා III වන වගුවේ නිශ්චිතව දක්වා ඇති පරිදි විකිරණ නියුක්ලයිඩවල සක්‍රියතාව හා අනුරූප ''ඩී'' අගයහි අනුපාතය මත පදනම්ව විකිරණශීලී ප්‍රභවයේ වර්ගය තීරණය කිරීමෙන් පසුව මෙහි I වන උපලේඛනයේ I වන වගුවේ ලැයිස්තුගත කර නොමැති නම් විකිරණශීලි ප්‍රභවයක් සඳහා සුරක්ෂිතතා මට්ටමකට වෙන් කරනු ලැබිය යුතු ය.

5. ප්ලුටෝනියම් - 239 සංයුක්ත වන විකිරණශීලි ප්‍රභව හැර, වෙනත් න්‍යෂ්ටික ද්‍රව්‍යයක් සඳහා මේ නියෝග අදාළ නොවිය යුතු ය.

6. මෙහි I වන උපලේඛනයේ I වන වගුවේ නිශ්චිතව දක්වා ඇති සියලු ''අ'', ''ආ'' සහ ''ඇ'' වන සුරක්ෂිතතා මට්ටම් කළමනාකරණය කිරීම සඳහා මේ නියෝග අදාළ විය යුතු ය.

7. යම් තැනැත්තෙකු මේ නියෝගවල නියමයන් සම්පූර්ණ නොකරන්නේ නම්, විකිරණශීලි ප්‍රභව කළමනාකරණය කිරීමෙහි නොයෙදිය යුතු ය.

8. (මෙහි මින්මතු ''පනත'' යනුවෙන් හඳුන්වනු ලබන) 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ 21 වන වගන්තිය ප්‍රකාරව (මෙහි මින්මතු ''ක්‍රියා පිළිවෙත'' යනුවෙන් හඳුන්වනු ලබන) අයනීකාර විකිරණ සම්බන්ධිත ක්‍රියා පිළිවෙතක් පැවැත්වීම සඳහා බලපත්‍රයක් අවශ්‍යවන අවස්ථාවක දී, මේ නියෝගවල දී ඇති නියම අනුගමනය කර ඇත්තේ ද යන්න තීරණය කිරීම සඳහා විකිරණශීලී ප්‍රභවයන්ට හා (විකිරණශීලි ප්‍රභව කළමනාකරණය සිදුකරනු ලබන ස්ථානය පිළිබඳ) සපයනු ලබන හෝ සැපයීමට ඇති සුරක්ෂිතතා වැඩපිළිවෙළ සම්බන්ධයෙන් වන තොරතුරු සපයන ලෙස (මෙහි මින්මතු ''සභාව'' යනුවෙන් හඳුන්වනු ලබන) පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති සභාව විසින් ඉල්ලුම්කරුට ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

9. සභාවේ ඉල්ලීම මත, සභාවේ බලපත්‍රලත් පහසුකමක යම් බලපත්‍රලාභියෙකු විසින්, අනවසර ක්‍රියා නැවැත්වීම හා වැළැක්වීම සඳහා සහ ප්‍රභවයන් ඉවත් කිරීම වැළැක්වීම සඳහා වන පූර්ව කටයුතු කිරීම සඳහා පහසුකමෙහි සහ ප්‍රභවයන්ගේ වීඩියෝ රූප බැලීමට සහ පහසුකමෙහි සිටින අදාළ තැනැත්තන් සමග සන්නිවේදනය කිරීමට වගකීමක් සහිත මාධ්‍ය මෙහෙයුමේ සේවක පිරිසට හැකියාව ඇති කිරීම සඳහා පහසුකමෙහි ස්ථාපනය කර ඇති භෞතික සුරක්ෂිතතා පද්ධතිය, සභාව විසින් නිර්දේශිත මධ්‍යම මෙහෙයුම් මධ්‍යස්ථානයකට සම්බන්ධ කිරීම සඳහා සුදුසු පියවර ගනු ලැබිය යුතු ය.

10. ඉල්ලුම්කරු මේ නියෝගවල ඇති නියමයන් සම්පූර්ණ කර නොමැති බවට පෙන්නුම් කරනු ලබන්නේ නම් සභාව විසින් බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

11. බලපත්‍රලාභියෙකු විසින් සුරක්ෂිතතා තත්ත්වය පිළිබඳව තොරතුරු ලබා ගැනීම සඳහා සහ නියාමන අවශ්‍යතා පිළිබඳ දක්වන අනුකූලතාව නිශ්චය කිරීම සඳහා විකිරණශීලී ප්‍රභව පිහිටා ඇති පරිශ්‍රයන්ට සහ පහසුකම්වලට වහාම ප්‍රවේශවීම සඳහා පනතේ 15 වන වගන්තිය යටතේ පත්කරන ලද යම් බලයලත් පරීක්ෂකයකුට අවසර දෙනු ලැබිය යුතු ය. විකිරණශීලී ප්‍රභවයන්ගේ සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් වන යම් තොරතුරු හෝ යම් වාර්තා නියම කරනු ලබන පරිදි එක් එක් බලපත්‍රලාභියා විසින් සභාව වෙත ලබා දිය යුතු ය.

12. මේ නියෝගවල යම් අදාළ නියමයකට අනුකූලවීමට යම් අපොහොසත්වීමක දී. බලපත්‍රලාභියෙකු විසින් -

(අ) පැය 24ක් ඇතුළත සභාවට ඒ පිළිබඳව වාර්තා කරනු ලැබිය යුතු ය ;

(ආ) අවස්ථානුගත කරුණු සඳහා ප්‍රතිකර්ම කිරීම සඳහා සහ සමාන අවස්ථාවන් නැවත ඇතිවීම වැළැක්වීම සඳහා වන නිසි ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතු ය ;

(ඇ) අපොහොසත් වීම සහ එහි හේතු, අවස්ථානුගත කරුණු හෝ ආනුශංගික ප්‍රතිඵල පිළිබඳව පරීක්ෂා කරනු ලැබිය යුතුය ; සහ

(ඈ) දින 30ක් ඇතුළත හෝ නියම කරනු ලබන පරිදි අපොහොසත් වීමට හේතු, එහි අවස්ථානුගත කරුණු හා ආනුශංගික ප්‍රතිඵල සහ ගන්නා ලද හෝ ගැනීමට නියමිත නිවැරදි කිරීමේ හෝ වැළැක්වීමේ ක්‍රියාමාර්ග පිළිබඳව වාර්තාවක් සභාව වෙත සපයනු ලැබිය යුතු ය.

13. විකිරණශීලී ප්‍රභවයක පාලනය අහිමිවීම. විකිරණශීලී ප්‍රභවයකට අනවසරයෙන් ඇතුළුවීම, සොරකම් කිරීම හෝ සොරකම් කිරීමට තැත් කිරීම හෝ විකිරණශීලී ප්‍රභවයකට හානි කිරීම සම්බන්ධිත අවස්ථාවක් සිදුව ඇති ඇති විට දී හෝ සිදුවන විට දී, බලපත්‍රලාභියකු විසින් -

(අ) වහාම සභාවට සහ නීතිය බලාත්මක කිරීමේ ආයතන වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය ;

(ආ) අවස්ථානුගත කරුණු සඳහා ප්‍රතිකර්ම කිරීම සඳහා සහ සමාන අවස්ථාවන් නැවත ඇතිවීම වැළැක්වීම සඳහා වන නිසි ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතු ය ;

(ඇ) සිදුවීම සහ එහි හේතු, අවස්ථානුගත කරුණු හෝ ආනුශංගික ප්‍රතිඵල පිළිබඳව පරීක්ෂා කරනු ලැබිය යුතුය ; සහ

(ඈ) දින 30ක් ඇතුළත හෝ නියම කරනු ලබන පරිදි සිදුවීම සඳහා වන හේතු, එහි අවස්ථානුගත කරුණු හා ආනුශංගික ප්‍රථිඵල සහ ගන්නා ලද හෝ ගැනීමට නියමිත නිවැරදි කිරීමේ හෝ වැළැක්වීමේ ක්‍රියාමාර්ග පිළිබඳව වාර්තාවක් සභාව වෙත සපයනු ලැබිය යුතු ය.

14. (1) බලපත්‍රලාභියා විසින් විකිරණශීලී ප්‍රභවයන්ගේ සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා අවශ්‍ය වන පියවර පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන වගකීම මෙන්ම මේ නියෝගයේ සියලු නියමයන්ට අනුකූලවීම සඳහා වන වගකීම දැරිය යුතු ය.

(2) බලපත්‍රලාභියා විසින් විකිරණශීලී ප්‍රභවයක සුරක්ෂිතතාව සඳහා බලපාන්නා වූ පහසුකම්වලට හෝ ක්‍රියාකාරකම්වලට යම් වෙනස් කිරීමක් කිරීම සඳහා බලපත්‍රලාභියා සතු චේතනාව සභාව වෙත දැනුම් දෙනු ලැබිය යුතු අතර එවැනි යම් වෙනස් කිරීමක් සඳහා සභාව විසින් නිශ්චිතව අවසර ලබාදෙන්නේ නම් මිස එවැනි වෙනස් කිරීමක් සිදු කරනු නොලැබිය යුතු ය.

15. මේ නියෝගවල අදාළ නියමයන්ට අනුකූල නොවීම අනාවරණය කර ගැනීම මත සභාව විසින් බලපත්‍රය අහෝසි කිරීම, අත්හිටුවීම, වෙනස් කිරීම හෝ විකිරණශීලී ප්‍රභවයක සන්තකය තහනම් කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

16. (1) මේ නියෝග මගින් ආරක්ෂාව හෝ සුරක්ෂිතභාවය පාලනය කරනු ලබන වෙනත් අදාළ වන නීති සහ රෙගුලාසිවලට අනුකූලව බලපත්‍රලාභියා කටයුතු කිරීමෙන් වැළැක්වීමක් සිදු නොවිය යුතු ය. මේ නියෝගයේ නියම සහ වෙනත් නීති හෝ නියෝගවල නියම අතර වන ගැටුමක දී, එම ගැටුම විසඳීම සඳහා එම ගැටීම පිළිබඳව සභාව වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) මේ නියෝගවල සඳහන් කිසිවක් ආරක්ෂාව හෝ සුරක්ෂිතතාව සඳහා අන්‍යාකාරයෙන් අවශ්‍ය විය හැකි යම් කටයුතු සීමා කරනු ලැබීමක් ලෙස තේරුම් නොගත යුතු ය.

(3) බලපත්‍රලාභියා විසින්, විකිරණශීලී ප්‍රභවයන්ගේ සුරක්ෂිතතාව සඳහා සුදුසු හෝ අවශ්‍ය යැයි සලකනු ලබන පරිදි, මේ නියෝග මගින් පනවනු ලබන නියමයන්ට අමතරව නියෝග, විධාන හෝ බලපත්‍රයක කොන්දේසි මගින් සභාව විසින් පනවනු ලබන යම් අමතර නියමවලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

17. බලපත්‍රලාභියා විසින් අවසරලත් ක්‍රියාකාරකමේ විශාලත්වය සහ ස්වභාවයට සරිලන පහත දැක්වෙන කරුණු සහතික කරනු ලබන, කළමනාකරණ පද්ධතියක් පිහිටුවනු ලැබිය යුතු යː-

(අ) සුරක්ෂිතාතාව ඉහළම ප්‍රමුඛතාව වශයෙන් ගෙන ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටීන් ආරම්භ කිරීම ;

(ආ) සුරක්ෂිතතාවයට බලපානු ලබන ගැටලු හඳුනා ගැනීම හා ඒවායේ වැදගත්කමට සරිලන ආකාරයකින් නිවැරදි කිරීම ;

(ඇ) සුරක්ෂිතතාව සඳහා එක් එක් තනි පුද්ගලයන්ගේ වගකීම් පැහැදිලිව හඳුනා ගැනීම සහ එක් එක් තනි පුද්ගලයන් සුදුසු පරිදි පුහුණු කිරීම සහ සුදුසුකම් සහිත වීම ;

(ඈ) සුරක්ෂිතතාව පිළිබඳ තීරණ සඳහා වන අධිකාරී බලය හඳුනාගනු ලැබීම; සහ

(ඉ) සුරක්ෂිතතාව පිළිබඳව සහ බලපත්‍රලාභියාගේ සම්පූර්ණ සංවිධානයේ විවිධ මට්ටම් පිළිබඳව තොරතුරු නිසිලෙස ගලා යාමක් ඇතිකරවන්නා වූ සංවිධානීය විධිවිධාන යෙදීම සහ සන්නිවේදන මාර්ග පිහිටුවීම.

18. (1) සුරක්ෂිතතාව පවතින්නේ කවර සේවක පිරිසක් මතද, එම සියලු සේවක පිරිස් නිසි පරිදි පුහුණු කර සුදුසුකම් සහිත පිරිස් බවට සහ දක්වා ඇති කාර්යපටිපාටීන්වලට අනුව කාර්ය ඉටුකරන බවට බලපත්‍රලාභියා විසින් සහතික කරනු ලැබිය යුතු ය. ඔවුන් සුදුසු පරිදි කලින් කල නැවත පුහුණු කිරීම හෝ නැවත සුදුසුකම් සහිත පිරිස් බවට පත් කිරීම සිදු කරනු ලැබිය යුතු ය. පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රමවත්ව අගයනු ලැබිය යුතු ය.

(2) ඵලදායී සුරක්ෂිතතා පියවරයන්ගේ වැදගත්කම පිළිබඳව සෑම සේවානියුක්තිකයකුටම වාර්ෂිකව දන්වනු ලැබිය යුතු ය.

19. බලපත්‍රලාභියෙකු විසින් -

(අ) සුරක්ෂිතතාව සම්බන්ධයෙන් නිශ්චිතව අදාළවන නියමයන් සම්පූර්ණ කරනු ලබන බවට ප්‍රමාණවත් සහතික කිරීමක් ;

(ආ) සුරක්ෂිතතා පද්ධතියේ කොටස් ඒවායේ කාර්ය කිරීම සඳහා ප්‍රමාණවත්, ගුණාත්මකබවකින් යුතු වන බවට සහතික කිරීමක් ; සහ

(ඇ) සුරක්ෂිතතා පියවරයන්ගේ සමස්ථ ඵලදායීතාව පරීක්ෂා කිරීම සහ තක්සේරු කිරීම සඳහා තත්ත්ව පාලන යාන්ත්‍රණ සහ කාර්යපටිපාටීන්.

සපයනු ලබන තත්ත්ව සහතික කිරීමේ වැඩසටහන් පිහිටුවනු ලැබිය යුතු ය.

20. බලපත්‍රලාභියෙකු විසින් -

(අ) සභාවෙන් අනුමතයක් ලබා ගෙන තිබේ නම් ;

(ආ) ප්‍රතිග්‍රාහකයාට ප්‍රභව සඳහා වලංගු බලපත්‍රයක් තිබේ නම් ; සහ

(ඇ) විකිරණශීලී ප්‍රභව ප්‍රවේසම් සහිතව සහ සුරක්ෂිතව කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වන සියලු අදාළ තාක්ෂණික තොරතුරු ප්‍රතිග්‍රාහකයා වෙත ලබා දී තිබේ නම්.

මිස වෙනත් පාර්ශවයකට යම් විකිරණශීලී ප්‍රභවයක් නොපවරනු ලැබිය යුතු ය.

21. මෙහි I වන උපලේඛනයේ I වන වගුවේ නිශ්චිතව දක්වා ඇති විකිරණශීලී ප්‍රභව වර්ග මත පදනම්ව වන සුරක්ෂිතතා මට්ටම් තුන සුරක්ෂිතතා පද්ධති ක්‍රියාකාරිත්වය සඳහා වන අවශ්‍යතා නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය. එක් එක් සුරක්ෂිතතා මට්ටමට අනුරූප අරමුණක් තිබිය යුතු ය. දී ඇති සුරක්ෂිතතා මට්ටමක් සඳහා සුරක්ෂිතතා පද්ධතිය මගින් සැපයීමට හැකියාව පැවතිය යුතු සමස්ත ප්‍රතිඵලය යන්න අරමුණ යන්නෙන් හැඳින්විය යුතු ය. එම මට්ටම් සහ අරමුණු පහත දැක්වෙන පරිදි විය යුතු ය.

(අ) ''අ'' වන සුරක්ෂිතතා මට්ටම - විකිරණශීලී ප්‍රභව අනවසරයෙන් ඉවත් කිරීම වැළැක්වීම, අනවසර ඇතුළුවීමකට හෝ අනවසර ඉවත්කිරීමකට තැත්කිරීමක් සිදු වුවහොත්, ප්‍රභවය ඉවත් කිරීම වැළැක්වීම සඳහා විරුද්ධවාදියාව නැවැත්වීමට ප්‍රමාණවත් කාලයකින් සහ ප්‍රමාණවත් සම්පත් සහිතව ප්‍රතිචාර දැක්වීමේ සේවක පිරිස් සඳහා හැකියාව ලබා දීම ;

(ආ) ''ආ'' වන සුරක්ෂිතතා මට්ටම - විකිරණශීලී ප්‍රභව අනවසරයෙන් ඉවත් කිරීමේ ශක්‍යතාවය අවම කිරීම, අනවසර ඇතුළුවීමකට හෝ අනවසර ඉවත් කිරීමකට තැත්කිරීමක් සිදුවුවහොත්, අයුතු ඇතුළුවීමක් සොයා ගැනීමෙන් සහ තක්සේරු කිරීමෙන් පසුව වහාම ප්‍රතිචාර දැක්වීම ආරම්භ කරනු ලැබිය යුතු ය ;

(ඇ) ''ඇ'' වන සුරක්ෂිතතා මට්ටම - විකිරණශීලී ප්‍රභව අනවසරයෙන් ඉවත් කිරීමේ ශක්‍යතාව අවම කිරීම.

22. යම් බලපත්‍රලාභියකු විසින් විකිරණශීලී ප්‍රභව අනවසරයෙන් ඉවත් කිරීම වැළැක්වීම සඳහා වන ''අ'' වන සුරක්ෂිතතා මට්ටමේ අරමුණ ඉටුකර ගැනීම සඳහා පහත දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු යඃ-

(1) සොයා ගැනීම ඃ-

(අ) ආක්‍රමණයක් හඳුනා ගැනීමේ ඉලෙක්ට්‍රොනික පද්ධතියක් සහ/හෝ ක්‍රියාකරුවන්ගේ අඛණ්ඩ සුපරීක්ෂණය භාවිතයෙන් ප්‍රදේශයක හෝ ප්‍රභවයක ආරක්ෂිත පිහිටීමට යම් අනවසරයෙන් ඇතුළුවීමක් සොයා ගැනීමට වහාම කටයුතු සලසනු ලැබිය යුතු ය ;

(ආ) යම් අනවසරයෙන් ඉවත් කිරීමට උත්සහ කරන ලද ප්‍රභවයක් පිළිබඳව (උදා -ඃ ඇතුළු තතු දන්නා අයකු) ඉලෙක්ට්‍රොනික බලපෑම්කිරීමක් සොයා ගැනීමේ උපකරණයක් සහ/හෝ ක්‍රියාකරුවන්ගේ අඛණ්ඩ සුපරීක්ෂණය භාවිතයෙන් සෙයා ගැනීමට වහාම කටයුතු සලස්වනු ලැබිය යුතු ය ;

(ඇ) සීසීටීවීයෙහි අධීක්ෂණය භාවිතයෙන් හෝ ක්‍රියාකරු විසින් හෝ ප්‍රතිචාර දක්වන සේවක පිරිස් මගින් සොයා ගැනීම වහාම තක්සේරු කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය ;

(ඈ) දුරකතන, ජංගම දුරකතන, පේජර හෝ ගුවන්විදුලි වැනි කඩිනම් සහ විශ්වසනීය සන්නිවේදන මාර්ග හරහා ප්‍රතිචාර දක්වන සේවක පිරිසට වහාම සන්නිවේදනය කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය ; සහ

(ඉ) භෞතික පරීක්ෂා කිරීම්, සීසීටීවී, බලපෑම් අගවන උපාංග මෙවලම් ආදිය මගින් දෛනිකව තහවුරු කිරීම හරහා නැතිවීමක් සොයා ගැනීම සඳහා ක්‍රමයක් සලස්වනු ලැබිය යුතු ය.

(2) ප්‍රමාද කිරීම ඃ-

සොයා ගැනීමෙන් පසුව, එය නැවැත්වීම සඳහා ප්‍රතිචාර දක්වන සේවක පිරිසට හැකියාව ඇති කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රමාදයක් එක්ව ලබාදෙන්නා වූ යටත් පිරිසෙයින් බාධක ස්තර දෙකේ පද්ධතියක් (උදා ඃ- බිත්ති, කුඩු) හරහා අනවසරයෙන් ඉවත් කිරීමකට බාධා කිරීම සඳහා සේවක පිරිසට ප්‍රමාණවත් ප්‍රතිචාර දැක්වීමට හැකිවන්නා වූ ප්‍රමාද කිරීම් සලස්වනු ලැබිය යුතු ය.

(3) ප්‍රතිචාර දැක්වීම ඃ-

බාධා කිරීමකට හැකියාව සහිත ප්‍රමාණය, උපකරණ සහ පුහුණුවීම් ඇතිව වහාම ප්‍රතිචාර දැක්වීම සඳහා වන හැකියාව හරහා අනවසර ඉවත් කිරීමට බාධා කිරීමට සහ එය වැළැක්වීමට ප්‍රමාණවත් වන සම්පත් සමග අනතුරු ඇඟවීමක් සඳහා වහාම ප්‍රතිචාර දැක්වීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය. සුරක්ෂිතතා හදිසි සැලැස්මක් සකස් කළ යුතු අතර, එය සුරක්ෂිතතා සිදුවීම කළමනාකරණය කිරීම සඳහා වගකිව යුතු අදාළ තැනැත්තන්ට සහ පාර්ශ්වකරුවන් වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

23. යම් බලපත්‍රලාභියකු විසින් විකිරණශීලී ප්‍රභව අනවසරයෙන් ඉවත් කිරීම අවම කිරීම සඳහා වන ''ආ'' වන සුරක්ෂිතතා මට්ටමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා පහත දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය ඃ-

(1) සොයා ගැනීම ඃ-

(අ) ආක්‍රමණයක් හඳුනා ගැනීමේ උපකරණයක් සහ/හෝ ක්‍රියාකරුගේ අඛණ්ඩ සුපරීක්ෂණය භාවිතයෙන් ප්‍රදේශයක හෝ ප්‍රභවයක ආරක්ෂිත පිහිටීමට යම් අනවසරයෙන් ඇතුළුවීමක් සොයා ගැනීමට කටයුතු සලසනු ලැබිය යුතු ය ;

(ආ) සොයා ගැනීමේ උපකරණයක් භාවිත කිරීම මගින් සහ/හෝ ක්‍රියාකරු විසින් වාර පරීක්ෂා කිරීම් සිදුකිරීම මගින් ප්‍රභවය අනවරසයෙන් ඉවත් කිරීමට යම් තැත් කිරීමක් සොයා ගැනීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය ;

(ඇ) සීසීටීවීයෙහි දුරස්ථ අධීක්ෂණය මගින් හෝ ක්‍රියාකරු විසින් හෝ ප්‍රතිචාර දක්වන සේවක පිරිසක් විසින් සොයා ගැනීම වහාම තක්සේරු කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය ;

(ඈ) දුරකතන, ජංගම දුරකතන, පේජර හෝ ගුවන්විදුලි වැනි කඩිනම් සහ විශ්වසනීය සන්නිවේදන මාර්ග හරහා ප්‍රතිචාර දක්වන තැනැත්තාට වහාම සන්නිවේදනය කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය ; සහ

(ඉ) භෞතික පරීක්ෂා කිරීම්, සීසීටීවී, බලපැම් අගවන උපාංග ආදිය මගින් දෛනිකව තහවුරු කිරීම හරහා නැතිවීමක් සොයා ගැනීම සඳහා ක්‍රමයක් සලස්වනු ලැබිය යුතු ය.

(2) ප්‍රමාද කිරීම :-

බාධක ස්තර දෙකේ පද්ධතියක් (උදා :- බිත්ති, කුඩු) හරහා අනවසරයෙන් ඉවත් කිරීමේ ශක්‍යතාව අවම කිරීම සඳහා ප්‍රමාද කිරීම් සලස්වනු ලැබිය යුතු ය.

(3) ප්‍රතිචාර දැක්වීම :-

වහාම ප්‍රතිචාර දැක්වීම ආරම්භ කිරීම සඳහා උපකරණ සහ ක්‍රියාමාර්ග භාවිතය හරහා අනවසරයෙන් ඉවත් කිරීමට බාධා කිරීම සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා වන ක්‍රමවේද විස්තර කරමින් සුරක්ෂිතතා හදිසි සැලැස්මක් සකස් කරනු ලැබිය යුතු අතර එය සුරක්ෂිතතා සිදුවීම කළමනාකරණය කිරීම සඳහා වගකිව යුතු අදාළ තැනැත්තන්ට සහ පාර්ශ්වකරුවන් සමග බෙදා ගනු ලැබිය යුතු ය.

24. යම් බලපත්‍රලාභියකු විසින් විකිරණශීලී ප්‍රභව අනවසරයෙන් ඉවත් කිරීම අවම කරනු ලබන ''ආ'' වන සුරක්ෂිතතා මට්ටමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා පහත දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය :-

(1) සොයා ගැනීම :-

(අ) ආක්‍රමණයක් සොයා ගැනීමේ උපකරණයක් භාවිත කිරීම මගින් සහ/හෝ ක්‍රියාකරු විසින් වාර පරීක්ෂා කිරීම් සිදු කිරීම මගින් ප්‍රභවය අනවසරයෙන් ඉවත් කිරීම සොයා ගැනීමට කටයුතු සලසනු ලැබිය යුතු ය ;

(ආ) ක්‍රියාකරු හෝ ප්‍රතිචාර දක්වන සේවක පිරිස් විසින් තක්සේරු කිරීමක් මගින් සොයා ගැනීම වහාම තක්සේරු කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය ; සහ

(ඇ) භෞතික පරීක්ෂා කිරීම්, බලපැම් අඟවන උපාංග ආදිය මගින් මාසිකව තහවුරු කිරීම හරහා පාඩුව සොයා ගැනීම සඳහා ක්‍රමයක් සලස්වනු ලැබිය යුතු ය ;

(2) ප්‍රමාද කිරීම :-

එක් බාධකයක් (උදා :- කුඩුව, ප්‍රභව නිවාසකරණය) භාවිතය මගින් හෝ ක්‍රියාකරු විසින් නිරීක්ෂණය කිරීම මගින් අනවසරයෙන් ඉවත් කිරීමේ සක්‍යතාවය අවම කිරීම සඳහා ප්‍රමාද කිරීම් සලස්වනු ලැබිය යුතු ය.

(3) ප්‍රතිචාර දැක්වීම :-

සුරක්ෂිතතා හදිසි සැලැස්මට අනුකූලව අවශ්‍ය ක්‍රියා මාර්ග හඳුනා ගැනීම සඳහා වන කාර්ය පටිපාටීන් භාවිතා කිරීම මගින් ප්‍රභවයක් අනවසර ඉවත් කිරීමක දී නිසි ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. වහාම ප්‍රතිචාර දැක්වීම සඳහා වන ක්‍රමවේද විස්තර කරමින් සුරක්ෂිතතා හදිසි සැලැස්මක් සකස් කරනු ලැබිය යුතු අතර එය සුරක්ෂිතතා සිදුවීම කළමනාකරණය කිරීම සඳහා වගකිව යුතු අදාළ තැනැත්තන් සහ පාර්ශ්වකරුවන් සමග බෙදා ගනු ලැබිය යුතු ය.

25. (1) ක්‍රියා පිළිවෙතක් ක්‍රියාත්මක කිරීම සඳහා පනතේ 21 වන වගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන යම් තැනැත්තකු විසින් ප්‍රභවයන්ගේ සහ පහසුකම්වල සුරක්ෂිතතා මට්ටම්වලට අනුකූලව 22 වන 23 වන සහ 24 වන නියෝගවල

දී ඇති නියමයන් ඉටු කිරීම සඳහා වන උපකරණ, මෙවළම්, බාධක, කුටි, ප්‍රභව සඳහා සපයනු ලබන සන්නිවේදන උපකරණ වර්ග සහ සොයා ගැනීම, ප්‍රමාද කිරීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා වන පහසුකම් විස්තර කරමින් ප්‍රභවයන්ගේ සහ පහසුකම්වල භෞතික සුරක්ෂිතතාවය සඳහා පිහිටුවන ලද වැඩපිළිවෙල ඇමුණුමක් ලෙස එම ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන අයදුම්පත සමග ඇමිණිය යුතු ය.

(2) ක්‍රියාපිළිවෙතක් ක්‍රියාත්මක කිරීමට පනතේ 21 වන වගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන යම් තැනැත්තකු විසින් සාධාරණ ලෙස පූර්වේක්ෂණය කළ හැකි සුරක්ෂිතතා සිදුවීම්, ආරම්භක සැලසුම්-කරන ලද ක්‍රියාමාර්ග සහ නිසි පහසුකම් සලසන සේවක පිරිසට සහ ප්‍රතිචාර දක්වන සේවක පිරිස වෙත පවරන ලද වගකීම් හඳුනාගනු ලබන සුරක්ෂිතතා හදිසි සැලැස්මක් ද එම ඉල්ලීම සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) ඉල්ලුම්කරු විසින්, ප්‍රභව සහ පහසුකම්වල භෞතික සුරක්ෂිතතාව අඛණ්ඩව ක්‍රියාත්මක වීම සහතික කිරීම සඳහා භෞතික සුරක්ෂිතතා පද්ධතිය පවත්වාගෙන යාමට වගකිව යුතු සේවක පිරිසකගේ නම් සහ සුදුසුකම් ඇතුළත් කරමින්, (1) වන උපවගන්තියේ දක්වා ඇති පරිදි ස්ථාපනය කරන ලද භෞතික සුරක්ෂිතතා පද්ධතිය සඳහා පිහිටුවන ලද පවත්වාගෙන යාමේ වැඩසටහන පිළිබඳව විස්තරයක් ඉල්ලීම සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) මේ නියෝග යටතේ භෞතික සුරක්ෂිතතා පද්ධතියක් ස්ථාපනය කිරීම සහ/හෝ පවත්වාගෙන යාම අවශ්‍යවන අවස්ථාවකදී යම් පාර්ශ්වයක් හෝ සමාගමක් භෞතික සුරක්ෂිතතා කොන්ත්‍රාත්කරුවෙකු ලෙස සභාවේ ලියාපදිංචි වී සිටින්නේ නම් මිස, එම පාර්ශ්වය හෝ සමාගම සමග භෞතික සුරක්ෂිතතා පද්ධතියක් ස්ථාපිත කිරීම සහ/හෝ පවත්වාගෙන යාම සඳහා ගිවිසුමක් බලපත්‍රලාභියා විසින් අත්සන් නොකරනු ලැබිය යුතු ය.

(5) යම් භෞතික සුරක්ෂිතතා කොන්ත්‍රාත්කරුවෙකු විසින් සභාවෙන් ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලබා ගැනීමෙන් තොරව, මේ නියෝග යටතේ භෞතික සුරක්ෂිතතා පද්ධතියක් ස්ථාපනය කිරීම හෝ පවත්වාගෙන යාම සැපයීම හෝ බාරගැනීම සිදු නොකරනු ලැබිය යුතු ය. පාර්ශ්වය හෝ සමාගම ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලීම නියම කර ඇති පරිදි වූ ආකෘතියෙන් යුතුව සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

26. බලපත්‍රලාභියකු විසින් සභාවේ අනුමැතිය සහිතව හැර යම් න්‍යෂ්ටික සුරක්ෂිතතා උපකාර සේවා සපයන්නකු වෙතින් න්‍යෂ්ටික සුරක්ෂිතතාව පිළිබඳ සේවක පිරිස පුහුණු කිරීම සඳහා වන සේවය ඇතුළුව න්‍යෂ්ටික සුරක්ෂිතතා සේවාවක් ලබා නොගත යුතු ය.

27. 21 වන නියෝගයේ සඳහන් අරමුණ ඉටුකර ගැනීම සඳහා බලපත්‍රලාභියකු විසින් : -

(අ) (i) හඳුනා ගැනීම සහ තහවුරු කිරීම මගින්, උදාහරණයක් ලෙස ''අ'' වන සුරක්ෂිතතා මට්ටම සඳහා ස්වයිප් කාඩ් කියවනය සහ පුද්ගලික හඳුනා ගැනීමේ අංකයක් මගින් පාලනය කරනු ලබන අගුල හෝ යතුර සහ යතුරු පාලනය මගින් අගුල දැමීම ; සහ

(ii) ''ආ'' වන සහ ''ඇ'' වන සුරක්ෂිතතා මට්ටම සඳහා එක් හඳුනා ගැනීමේ මිණුමක් මගින්,

අවසරලත් තැනැත්තන්ට ප්‍රවේශය එළඳායී ලෙස සීමා කරනු ලැබූ ප්‍රවේශය පාලනයක් ප්‍රභවය පිහිටි ස්ථානයට සපයනු ලැබිය යුතු ය.

(ආ) ප්‍රභවය පිහිටි ස්ථානයට අනාරක්ෂිතව ප්‍රවේශ වීම සඳහා සහ සංවේදී තොරතුරුවලට ප්‍රවේශ වීම සඳහා අවසර ලත් සියලු සේවක පිරිස් සඳහා පසුබිම් පරීක්ෂා කිරීම මගින් අවසරලත් සියලු පුද්ගලයන්ගේ විශ්වසනීයභාවය සහතික කර ගනු ලැබිය යුතු ය ;

(ඇ) සංවේදී තොරතුරු හඳුනා ගැනීම සහ එම තොරතුරු අනවසරයෙන් හෙළිදරව් කිරීමෙන් ආරක්ෂා කර ගැනීම සඳහා වන කාර්ය පටිපාටීන් භාවිත කිරීම හරහා සංවේදී තොරතුරු හඳුනා ගැනීම සහ ආරක්ෂා කිරීම සිදු කරනු ලැබිය යුතු ය ;

(ඈ) 3 වන නියෝගයන්ට අනුකූලවීම සඳහා ස්ථානීය සුරක්ෂිතතා සැලැස්මක් සහ ''අ'' වන සුරක්ෂිතතා මට්ටම සහ ''ආ'' වන සුරක්ෂිතතා මට්ටම සඳහා වැඩි වූ තර්ජන මටටම්වලට ප්‍රතිචාර දැක්වීමට සැලැස්වීම සඳහා ලිඛිත සුරක්ෂිතතා වැඩපිළිවෙලක් සහ (''ඇ'' වන සුරක්ෂිතතා මට්ටම සඳහා) නිර්දේශිත කාර්ය පටිපාටි මගින්, සුරක්ෂිතතා සැලැස්මක් සපයනු ලැබිය යුතු ය ;

(ඉ) සුරක්ෂිතතාව සම්බන්ධ අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා වන කාර්ය පටිපාටීන් හරහා සුරක්ෂිතතා සැලසුම් මගින් ආවරණය කරන ලද සුරක්ෂතතා සිදුවීම් කළමනාකරණය කිරීම සඳහා ඇති හැකියාව සහතික කරනු ලැබිය යුතු ය ; සහ

(ඊ) සුරක්ෂිතතා සිදුවීම වාර්තා කිරීමේ පද්ධතියක් ආරම්භ කරනු ලැබිය යුතු ය.

28. බලපත්‍රලාභියා විසින්, ප්‍රභව කළමනාකරණය කිරීම සඳහා යොදා ගන්නා වූ පහසුකම ඇතුළුව පහත දැක්වෙන අවශ්‍යතාවයන් සම්පූර්ණ කරනු ලබන ''අ'' වන සහ ''ආ'' වන සුරක්ෂිතතා මට්ටම්වල විකිරණශීලි ප්‍රභව සඳහා ස්ථාන සුරක්ෂතතා සැලැස්මක් සකස් කරනු ලැබිය යුතු ය. :-

(අ) මෙහි II වන උපලේඛනයේ දක්වා ඇති පරිදි සියලු අවශ්‍යතා ස්ථාන සුරක්ෂිතතා සැලැස්මේ අන්තර්ගත විය යුතු ය ;

(ආ) ස්ථාන සුරක්ෂිතතා සැලැස්ම අදාළ වන පරිදි ''අ'' වන හෝ ''ආ'' වන සුරක්ෂිතතා මට්ටම් සඳහා නියම කරනු ලබන සුරක්ෂිතතා අරමුණු සහ පියවර අනුව වාර්ෂිකව පරීක්ෂා කිරීම සහ ඇගයීමට ලක් කිරීම සිදු කරනු ලැබිය යුතු ය. ස්ථාන සුරක්ෂිතතා සැලැස්ම පරීක්ෂා කිරීමේ ප්‍රතිඵලය මත පදනම්ව සමාලෝචනය කරනු ලැබිය යුතු ය. සැලැස්මේ හෝ සුරක්ෂිතතා පද්ධතිවල යම් අඩුපාඩුවක් පිළිබඳව නිසි ලෙස අවධානය යොමු කරනු ලැබිය යුතු අතර සභාවට ඒ පිළිබඳව වාර්තා කරනු ලැබිය යුතු ය ; සහ

(ඇ) අවස්ථාවෝචිත පරිදි අනුමතය සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කරන්නකු විසින් ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රයේ කොටසක් ලෙස සහ බලපත්‍රලාභියකු විසින් ඉදිරිපත් කරන ලද බලපත්‍රය අලුත් කිරීමේ ඉල්ලුම් පත්‍රයේ කොටසක් ලෙස ස්ථාන සුරක්ෂිතතා සැලැස්ම සහ එම සැලැස්මට සිදු කරන ලද යම් වෙනස් කිරීමක් සභාව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

29. ජංගම හෝ අතේ ගෙනයා හැකි විකිරණශීලි ප්‍රභව සඳහා 22 වන, 23 වන සහ 24 වන නියෝගවල සඳහන් වන නියමයන් සම්පූර්ණ කිරීම සිදු කළ නොහැකි අවස්ථාවක දී, බලපත්‍රලාභියා විසින් සමාන සුරක්ෂිතතා මට්ටමක් ලබා දීම සඳහා භාවිත කරනු ලබන පියවර පිළිබඳ විස්තරයක් ඉල්ලුම්පත්‍රයෙහි සහ සුරක්ෂිතතා සැලැස්මෙහි ඇතුළත් කරනු ලැබිය යුතු ය.

30. (1) විකිරණශීලි ප්‍රභවයක් ඉලක්ක කරමින් නිශ්චිත තර්ජනයක් තිබීම පිළිබඳව බලපත්‍රලාභියා දැනුවත්වත් වන්නේ නම් හෝ එවැනි කරුණක් පිළිබඳව සැක කරන්නේ නම්, බලපත්‍රලාභියා විසින් තර්ජනයට අනුව සුරක්ෂිතතා පියවර ඉහළ දැමිය යුතු අතර ගනු ලැබූ සුරක්ෂිතතා පියවර පිළිබඳව සභාව වෙත වහාම දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) ඉහළ දැමූ සුරක්ෂිතතා පියවරයන්ට පහත දැක්වෙන පියවර ඇතුළත් විය හැකි ය :-

(අ) ප්‍රභවය භාවිත කරනු ලබන්නේ නම්, එම ප්‍රභවය එහි ආරක්ෂිත ගබඩා කිරීමේ ස්ථානයට ආපසු එවීම ;

(ආ) අමතර වීඩියෝ කැමරා හෝ අමතර බලපෑම් ඇඟවීමේ සංඥා භාවිත කරමින් පැය 24ක ආරක්ෂාවක් ලබාදීම ;

(ඇ) සැක සහිත තර්ජනය පිළිබඳව නීති බලාත්මක කරනු ලබන තැනැත්තන් සහ නියාමන සභාව දැනුවත් බවට සහතික කිරීම ;

(ඈ) සුරක්ෂිතතා කාර්ය පටිපාටි, පහසුකම් පිරිසැලසුම සහ විකිරණ ආරක්ෂක පරිචයන් නීතිය බලාත්මක කරනු ලබන සහ හදිසි ප්‍රතිචාර දක්වන සේවක පිරිස සමග සමාලෝචනය කිරීම ; සහ

(ඉ) විකිරණශීලී හදිසි තත්ත්වයන් හැසිරවිය හැකි, හොඳින් සූදානම් කරන ලද පුහුණු සේවක පිරිසක් සහිත වෛද්‍ය පහසුකම් ඇතුළුව හදිසි ප්‍රතිචාර දැවීමේ කාර්ය පටිපාටි වලංගුව පවතින බව සහතික කිරීම.

(3) නිශ්චිත තර්ජනය පවතින තුරු සුරක්ෂිතතා කාර්ය පටිපාටි ඉහළ දැමීම අඛණ්ඩව සිදු කරනු ලැබිය යුතු ය.

(4) ප්‍රභව බාරදෙනු ලබන, නැව්ගත කරනු ලබන කාල පරිච්ඡේදවල දී හෝ වෙනත් අවදානම් සහිත තත්ත්වයන් (උදා:- ප්‍රභව හුවමාරුව, නඩත්තුව) වල දී ''අ'' වන සහ ''ආ'' වන සුරක්ෂිතතා මට්ටමේ විකිරණශීලී ප්‍රභවවල සුරක්ෂිතතා පියවර ඉහළ දැමීම සිදුකරනු ලැබිය යුතුය.

31. (1) සභාව විසින් පරීක්ෂා කිරීම සඳහා බලපත්‍රලාභියා විසින් විකිරණශීලී ප්‍රභවවල වාර්ෂික ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර යාවත්කාලීන කරන ලද එම ලේඛනවල වාර්තා තබාගනු ලැබිය යුතු ය.

(2) විකිරණශීලී ප්‍රභව මාරු කිරීම හෝ ලැබීම මත විකිරණශීලී ප්‍රභවවල ලේඛන සකස් කරනු ලැබිය යුතු ය.

(3) එක් එක් විකිරණශීලී ප්‍රභව වාර්තාවල පහත දැක්වෙන කරුණු ඇතුළත් විය යුතු ය :-

(අ) ප්‍රභවය පිහිටි ස්ථානය ;

(ආ) විකිරණ නියුක්ලයිඩ ;

(ඇ) නිශ්චිත දිනක දී විකිරණශීලීතාව ;

(ඈ) අනුක්‍රමික අංකය හෝ අනන්‍යතාව හඳුනා ගැනීම ;

(ඉ) රසායනික සහ භෞතික ස්වරූපය ;

(ඊ) ගබඩා කරන ස්ථානය තුළට සහ ඉන් පිටතට සිදු කරනු ලද සියලු චලනයන් වාර්තා කිරීම ඇතුළු ප්‍රභවය භාවිත කිරීමේ ඉතිහාසය ;

(උ) ප්‍රභවය ලැබීම, මාරු කිරීම හෝ බැහැර කිරීම ; සහ

(ඌ) සුදුසු පරිදි, ප්‍රභවය හඳුනාගත හැකි සහ සොයා ගත හැකි වෙනත් තොරතුරු.

32. මේ නියෝගවල :-

''පනත'' යන්නෙන්, 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත අදහස් වේ ;

''ඉල්ලුම්කරු'' යන්නෙන්, 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ 21 වන වගන්තිය මගින් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන තැනැත්තකු අදහස් වේ ;

''සභාව'' යන්නෙන්, 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව අදහස් වේ ;

''ප්‍රමාද කිරීම'' යන්නෙන්, බාධක හෝ වෙනත් භෞතික ක්‍රම හරහා, විකිරණශීලී ප්‍රභවයකට අනවසර ප්‍රවේශය ලබා ගැනීමට හෝ විකිරණශීලී ප්‍රභවයක් ඉවත් කිරීමට හෝ කඩාකප්පල් කිරීමට විරුද්ධවාදියෙකුට අවශ්‍ය වන කාලය වැඩි කිරීම සඳහා නිර්මාණය කරන ලද භෞතික සුරක්ෂිතතා පද්ධතියක අංගයක් අදහස් වේ ;

''සොයා ගැනීම'' යන්නෙන්, ඇති විය හැකි ද්වේශ සහගත හෝ වෙනත් අනවසර ක්‍රියාවක් දැනීමෙන් ආරම්භ වන්නා වූ භෞතික සුරක්ෂිතතා පද්ධතියක ක්‍රියාවලියක් අදහස් වන අතර එය අනතුරු සංඥාවේ හේතුව තක්සේරු කිරීම සමග සම්පූර්ණ වේ ;

''පහසුකම'' යන්නට, 2014 අංක 40 දරන පරමාණුක බලශක්ති පනතේ එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය ;

''ආනයනය'' යන්නෙන්, මේ නියෝග මගින් ආවරණය වන විකිරණශීලී ප්‍රභව එකක් හෝ කිහිපයක් අපනයනය කරනු ලබන රාජ්‍යයකින් ආරම්භ වෙමින්, ආනයනය කරනු ලබන රාජ්‍යයකට හෝ ආනයනය කරනු ලබන රාජ්‍යයක සිටිනු ලබන ප්‍රතිග්‍රාහකයෙකුට භෞතිකව මාරු කිරීම අදහස් වේ ;

''අයනීකාර විකිරණය'' යන්නට, 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය ;

''බලපත්‍රය'' යන්නට, 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය ;

''බලපත්‍රලාභියා'' යන්නට, 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය ;

''කළමනාකරණය'' යන්නෙන්, විකිරණශීලී ප්‍රභව නිෂ්පාදනය කිරීම. සැපයීම. ප්‍රතිග්‍රහණය, සන්තකයේ තබා ගැනීම. ගබඩා කිරීම, භාවිත කිරීම, මාරු කිරීම, ආනයනය කිරීම, අපනයනය කිරීම, නඩත්තු කිරීම. ප්‍රතිචක්‍රීකරණය කිරීම හෝ බැහැර කිරීම යනාදියට සම්බන්ධිත පරිපාලන සහ මෙහෙයුම් කටයුතු අදහස් වේ ;

''ද්වේශ සහගත ක්‍රියාව'' යන්නෙන්, විකිරණශීලී ප්‍රභවයක් අනවසරයෙන් ඉවත් කිරීමක් හෝ අනවසරයෙන් ඉවත් කිරීමට තැත් කිරීමක් හෝ කඩාකප්පල් ක්‍රියාව අදහස් වේ ;

''න්‍යෂ්ටික ද්‍රව්‍ය'' යන්නට, 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

''භෞතික සුරක්ෂිතතා කොන්ත්‍රාත්කරු'' යන්නෙන්, මේ නියෝග යටතේ නියමිත භෞතික සුරක්ෂිතතා උපකරණ ස්ථාපනය කිරීම. නඩත්තු කිරීම සහ තැනැත්තන් පුහුණු කිරීම සඳහා නිසි සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ප්‍රමාණවත් මානව සම්පත් ඇති සභාවේ ලියාපදිංචි තැනැත්තකු හෝ සමාගමක් අදහස් වේ ;

''භෞතික සුරක්ෂිතතා පද්ධතිය'' යන්නෙන්, ද්වේශ සහගත ක්‍රියාවක් සම්පූර්ණවීම වැළැක්වීමේ අරමුණින් යුතු භෞතික ආරක්ෂණ පියවර ඒකාබද්ධ සමූහයක් අදහස් වේ ;

''අයනීකාර විකිරණය සම්බන්ධිත ක්‍රියා පිළිවෙත'' යන්නට, 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

''විකිරණශීලී ද්‍රව්‍ය'' යන්නට, 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

''ප්‍රතිචාර දැක්වීම'' යන්නෙන්, විරුද්ධවාදියා සාර්ථකවීම වැළැක්වීම සඳහා සහ ඇතිවිය හැකි තදබල ප්‍රතිවිපාක අවම කිරීම සඳහා සොයා ගැනීම අනුව සිදුකිරීමට බාරගනු ලබන කටයුතු අදහස් වේ. මේ කටයුතු සාමාන්‍යයෙන් ආරක්ෂක හෝ නීති බලාත්මක කරනු ලබන තැනැත්තන් විසින් සහ වෙනත් රාජ්‍ය නියෝජිතයන් විසින් සිදුකරනු ලබන අතර තැත් කරන ලද අනවසර ඉවත් කිරීම හෝ කඩාකප්පල් ක්‍රියාව සිදු කරන අතරතුර දී විරුද්ධවාදියාට බාධා කිරීම සහ විරුද්ධවාදියා මැඩපැවැත්වීම, විකිරණශීලී ප්‍රභව භාවිත කරමින් අහිතකර ප්‍රතිඵල ඇති කිරීමෙන් විරුද්ධවාදියා වැළැක්වීම, විකිරණශීලී ප්‍රභවය ප්‍රතිපූරණය කිරීම හෝ අන්‍යාකාරයකින් ප්‍රථිඵලවල බරපතල බව අඩු කිරීම ඇතුළත් වේ ;

''කඩාකප්පල් ක්‍රියාව'' යන්නෙන්, විකිරණයට හෝ විකිරණශීලී ද්‍රව්‍ය මුදාහැරීමට නිරාවරණය වීම මගින් සේවක පිරිසගේ, මහජනතාවගේ හෝ පරිසරයේ සෞඛ්‍ය සහ ප්‍රවේශම සෘජුව හෝ වක්‍රව අනතුරට පත්කරනු ලැබිය හැකි විකිරණශීලී ප්‍රභවයක් හෝ ආශ්‍රිත පහසුකමක් කටයුත්තක් සම්බන්ධව මෙහෙයවනු ලබන යම් චේතානාන්විත ක්‍රියාවක් අදහස් වේ

''ප්‍රවේසම'' යන්නට 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

''සුරක්ෂිතතා සංස්කෘතිය'' යන්නෙන්, න්‍යෂ්ටික සුරක්ෂිතතාවය සඳහා සහාය වීම, වැඩිදියුණු කිරීම සහ පවත්වා ගැනීම වෙනුවෙන් සේවය කරනු ලබන තනි පුද්ගලයන්ගේ, සංවිධානවල සහ ආයතනවල චරිත ලක්ෂණ, ආකල්ප සහ හැසිරීම්වල එකතුවක් අදහස් වේ ;

''සුරක්ෂිතතා හදිසි සැලැස්ම'' යන්නෙන්, සාධාරණ ලෙස පූර්වේක්ෂණය කළ හැකි සුරක්ෂිතතා සිදුවීම් හඳුනාගනු ලබන, ආරම්භක සැලසුම් කරන ලද කටයුතු සපයනු ලබන, (නිසි අධිකාරීන්ට අනතුරු ඇඟවීම ඇතුළුව) සහ නිසි මෙහෙයුම් කාර්ය මණ්ඩිකයන්ට සහ ප්‍රතිචාර දක්වන කාර්ය මණ්ඩලිකයන්ට වගකීම් පවරනු ලබන සුරක්ෂිතතා සැලැස්මේ කොටසක් හෝ තනි ලියවිල්ලක් අදහස් වේ ;

''ස්ථාන සුරක්ෂිතතා සැලැස්ම'' යන්නෙන්, පහසුකමක ස්ථානගත කර ඇති සුරක්ෂිතතා වැඩපිළිවෙල පිළිබඳව සවිස්තර විස්තරයක් ඉදිරිපත් කරන්නා වූ, ක්‍රියාකරු විසින් සකස් කරන ලද ලේඛනයක් අදහස් වේ ;

''සුරක්ෂිතතා සිදුවීම'' යන්නෙන්, න්‍යෂ්ඨික සුරක්ෂිතතාවය සඳහා බලපෑම් ඇති ලෙසට ඇගයීම් කරනු ලබන සිදුවීමක් අදහස් වේ ;

''ගබඩා කිරීම'' යන්නෙන්, නැවත ලබා ගැනීමේ අදහසින් යුතුව විකිරණශීලී ද්‍රව්‍ය දරා සිටීමට සලස්වනු ලබන පහසුකමක් තුළ විකිරණශීලී ද්‍රව්‍ය රඳවා තැබීම අදහස් වේ ;

''තර්ජනය'' යන්නෙන්, ද්වේශ සහගත ක්‍රියාවක් කිරීම සඳහා අභිප්‍රේරණය, චේතනාව සහ ශක්‍යතාවය සහිත තැනැත්තකු හෝ තැනැත්තන් කණ්ඩායමක් අදහස් වේ ;

''විශ්වසනීයභාවය තීරණය කිරීම'' යන්නෙන්, ඇතුළත සිටින තැනැත්තන් බවට පත්විය හැකි තැනැත්තන්ගේ අභිප්‍රේරණය හෝ හැසිරීම හඳුනා ගැනීම සඳහා අදහස් කරනු ලබන සේවා නියුක්ත කිරීමට පෙර සිදුකරන පරීක්ෂාවන්වල දී සහ සේවා නියුක්තිය අතරතුර දී සිදු කරන පරීක්ෂණවල දී තනි පුද්ගලයන්ගේ සෘජුභාවය, අවංකභාවය සහ විශ්වසනීයභාවය පිළිබඳව සිදු කරනු ලබන ඇගයීමක් අවශ්‍ය වේ ;

''අනවසර ඉවත් කිරීම'' යන්නෙන්, විකිරණශීලී ප්‍රභව සොරකම් කිරීම හෝ වෙනත් නීති විරෝධී ගැනීමක් අදහස් වේ.

''විකිරණශීලී ප්‍රභවය'' යන්නට, 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

**I වන උපලේඛනය**

(3 වන, 4 වන, 6 වන සහ 21 වන නියෝග)

***I වන වගුව***

පොදුවේ භාවිත කෙරෙන ප්‍රභව සඳහා වෙන් කරන ලද සුරක්ෂිතතා මට්ටම්

| *සුරක්ෂිතතා මට්ටම* | *ප්‍රභවය* | *වර්ගය* |
|---|---|---|
| අ | විකිරණ සමස්ථානික තාප විද්‍යුත් ජනක (ආර්.ටී.ජී)<br>ජීවානුහරණයේ දී සහ ආහාර සංරක්ෂණයේ දී භාවිත කරනු ලබන ප්‍රවිකිරකය<br>ස්වයං නිරාවරක ප්‍රවිකිරකයන්<br>රුධිර/පටක ප්‍රවිකිරකයන්<br>දුර චිකිත්සා ප්‍රභව<br>අචල බහුකදම්බ දුර චිකිත්සා (ගැමා තල) ප්‍රභව | 1 |
| ආ | කාර්මික ගැමා කිරණ ලේඛන ප්‍රභව<br>ඉහළ/මධ්‍යම මාත්‍රා අනුප්‍රමාණ<br>බ්‍රැචි තෙරපි ප්‍රභව | 2 |
| ඇ | විවිධ ප්‍රභව වර්ග සහ රේඩියෝ නියුක්ලයිඩ<br>සම්බන්ධයෙන් පහත දක්වා<br>ඇති ඉහළ ක්‍රියාකාරීත්වයෙන් යුතු<br>විකිරණශීලී ප්‍රභව සංස්ථාපනය කරන්නා වූ<br>ස්ථාවර/ජංගම කාර්මික ආමාන.<br>ආමාන මට්ටම්<br>Cs - 137 : සක්‍රියතාව 3.7 E - 02 $TB_q$ හෝ ඉහළ<br>Co - 60 : සක්‍රියතාව 3.7 E - 03 $TB_q$ හෝ ඉහළ<br><br>ක්‍රමාංකන ප්‍රභව,<br>Am - 241 : සක්‍රියතාව 1.9 E - 01 $TB_q$ හෝ ඉහළ<br>Pu - 239/Be : සක්‍රියතාව 7.4 E - 02 $TB_q$ හෝ ඉහළ<br><br>වාහක ආමාන.<br>Cs - 137 : සක්‍රියතාව 1.1 E - 04 $TB_q$ හෝ ඉහළ<br>Cf - 252 : සක්‍රියතාව 1.4 E - 03 $TB_q$ හෝ ඉහළ<br>පිපිරුම් උඳුන ආමාන.<br>Co - 60 : සක්‍රියතාව 3.7 E - 02 $TB_q$ හෝ ඉහළ<br>ඩ්‍රෙජර් ආමාන (මඩ කැනිය ආමාන).<br>Cs - 137 : සක්‍රියතාව 7.4 E - 03 $TB_q$ හෝ ඉහළ<br>C0 - 60 : සක්‍රියතාව 9.3 E - 03 $TB_q$ හෝ ඉහළ<br><br>තෙල් ළිං ගවේෂණ ආමාන.<br>Am - 241/Be : සක්‍රියතාව 1.9 E - 02 $TB_q$ හෝ ඉහළ<br>Cs - 137 : සක්‍රියතාව 3.7 E - 02 $TB_q$ හෝ ඉහළ<br>Cf - 252 : සක්‍රියතාව 1.0 E - 03 හෝ ඉහළ | 3 |

***II* වන වගුව**

**විකිරණශීලී ප්‍රභව වර්ගීකරණ කිරීම**

විකිරණ නියුක්ලයිඩවල සක්‍රීයතා සහ අනුරූප "ඩී" වටිනාකම අතර අනුපාතය (අන්තරාදායක ප්‍රභවය) ප්‍රකාරව විකිරණශීලී ප්‍රභව 1 වන වර්ගයේ සිට 5 වන වර්ගය දක්වා වර්ග කරනු ලබන අතර මෙම අනුරූප D වටිනාකම ප්‍රභවය, පාලනය යටතේ නොපවතින්නේ නම්, ආවරණය නොවූ විකිරණශීලී ප්‍රභවයකින් බාහිර නිරාවරණය සහ ප්‍රභවයක විසිරුවා හැරීමකින් අභ්‍යන්තර නිරාවරණය යන දෙකම ඇතුළත්ව, සිද්ධාම පෙළකට තදබල නියතිවාදී බලපෑම් ඇති කරනු ලැබිය හැකි, විකිරණශීලී ප්‍රභවයක විකිරණ නියුක්ලයිඩයේ විශිෂ්ට සක්‍රීයතාව වේ.

විකිරණ නියුක්ලයිඩ සක්‍රීයතා (A) සහ D[a] වටිනාකම මත පදනම්ව විකිරණශීලී ප්‍රභව සඳහා වර්ග ඇගයීම.

| *සක්‍රීයතා අනුපාතය (A/D)* | *D වටිනාකම මත පදනම්ව* | *වර්ගය* |
|---|---|---|
| A/D ≥ 1000 | A ≥ 1000 D | 1 |
| 1000 > A/D ≥ 10 | 1000 D > A ≥ 10 D | 2 |
| 10 > A/D ≥ 1 | 10 D > A ≥ 1 D | 3 |
| 1 > A/D ≥ 0.01 | 1 D > A ≥ 0.01 D | 4 |
| 0.01 > A/D සහ පාලනයෙන් නිදහස් සක්‍රීයතාවයට වැඩි | 0.01 D > A සහ පාලනයෙන් නිදහස් සක්‍රීයතාවයට වැඩි | 5 |

a. තෝරාගත් විකිරණ නියුක්ලයිඩ සඳහා වන D වටිනාකම්

III. වන වගුවේ 3 වන තීරුවේ සඳහන් වේ.

**III වන වගුව**

**තෝරාගත් විකිරණ නියුක්ලයිඩ සඳහා අන්තරාදායක ප්‍රභවයන් (D අගය) සඳහා අනුරූප සක්‍රීයතාවය සහ එහි ගුණාකාර**

| *විකිරණ නියුක්ලයිඩ* | *1000xD* | | *10xD* | | *D* | |
|---|---|---|---|---|---|---|
| | *(TBq)* | *(Ci)[a]* | *(TBq)* | *(Ci)[a]* | *(TBq)* | *(Ci)[a]* |
| Am-241 | 6.E+01 | 2.E+03 | 6.E-01 | 2.E+01 | 6.E-02 | 2.E+00 |
| Am-241/Be | 6.E+01 | 2.E+03 | 6.E-01 | 2.E+01 | 6.E-02 | 2.E+00 |
| Cf-252 | 2.E+01 | 5.E+02 | 2.E-01 | 5.E-00 | 2.E-02 | 5.E-01 |
| Cm-244 | 5.E+01 | 1.E+03 | 5.E-01 | 1.E+01 | 5.E-02 | 1.E+00 |
| Co-60 | 3.E+01 | 8.E+02 | 3.E-01 | 8.E+00 | 3.E-02 | 8.E-01 |
| Cs-137 | 1.E+02 | 3.E+03 | 1.E+00 | 3.E+01 | 1.E-01 | 3.E+00 |
| Gd-153 | 1.E+03 | 3.E+04 | 1.E+01 | 3.E+02 | 1.E+00 | 3.E+01 |
| Ir-192 | 8.E+01 | 2.E+03 | 8.E-01 | 2.E+01 | 8.E-02 | 2.E+00 |
| Pm-147 | 4.E+04 | 1.E+06 | 4.E+02 | 1.E+04 | 4.E+01 | 1.E+03 |
| Pu-238 | 6.E+01 | 2.E+03 | 6.E-01 | 2.E+01 | 6.E-02 | 2.E+00 |
| Pu-239[b]/Be | 6.E+01 | 2.E+03 | 6.E-01 | 2.E+01 | 6.E-02 | 2.E+00 |
| Ra-226 | 4.E+01 | 1.E+03 | 4.E-01 | 1.E+01 | 4.E-02 | 1.E+00 |
| Se-75 | 2.E+02 | 5.E+03 | 2.E+00 | 5.E+01 | 2.E-01 | 5.E+00 |
| Sr-90(Y-90) | 1.E+03 | 3.E+04 | 1.E+01 | 3.E+02 | 1.E+00 | 3.E+01 |
| Tm-170 | 2.E+04 | 5.E+05 | 2.E+02 | 5.E+03 | 2.E+01 | 5.E+02 |
| Yb-169 | 3.E+02 | 8.E+03 | 3.E+00 | 8.E+01 | 3.E-01 | 8.E+00 |

| *විකිරණ නියුක්ලයිඩ* | *1000xD* | | *10xD* | | *D* | |
|---|---|---|---|---|---|---|
| | *(TBq)* | *(Ci)*[a] | *(TBq)* | *(Ci)*[a] | *(TBq)* | *(Ci)*[a] |
| Au-198* | 2.E+02 | 5.E+03 | 2.E+00 | 5.E+01 | 2.E-01 | 5.E+00 |
| Cd-109* | 2.E+04 | 5.E+05 | 2.E+02 | 5.E+03 | 2.E+01 | 5.E+02 |
| Co-57* | 7.E+02 | 2.E+04 | 7.E+00 | 2.E+02 | 7.E-01 | 2.E+01 |
| Fe-55* | 8.E+05 | 2.E+07 | 8.E+03 | 2.E+05 | 8.E+02 | 2.E+04 |
| Ge-68* | 7.E+01 | 2.E+03 | 7.E-01 | 2.E+01 | 7.E-02 | 2.E+00 |
| Ni-63* | 6.E+04 | 2.E+06 | 6.E+02 | 2.E+04 | 6.E+01 | 2.E+03 |
| Pd-103* | 9.E+04 | 2.E+06 | 9.E+02 | 2.E+04 | 9.E+01 | 2.E+03 |
| Po-210* | 6.E+01 | 2.E+03 | 6.E-01 | 2.E+01 | 6.E-02 | 2.E+00 |
| Ru-106(Rh-106)* | 3.E+02 | 8.E+03 | 3.E+00 | 8.E+01 | 3.E-01 | 8.E+00 |
| Tl-204* | 2.E+04 | 5.E+05 | 2.E+02 | 5.E+03 | 2.E+01 | 5.E+02 |

a. භාවිතා කිරීම සඳහා වන මූලික වටිනාකම් TBq හී දැක්වේ. කියුරි වටිනාකම ප්‍රායෝගික භාවිතය සඳහා සපයනු ලබන අතර පරිවර්තනය කිරීමෙන් පසුව වටයා ඇත.

b. ''ඩී'' ගුණනයන් සඳහා අවදානම සහ ආරක්ෂණ ගැටළු සලකා බැලිය යුතු ය.

* මෙම විකිරණ නියුක්ලයිඩ තනි විකිරණ ප්‍රභව ලෙස ගත් කල එහි සක්‍රියතාවයන් 1 වන, 2 වන, 3 වන වර්ගවලට නොවැටෙන තරම් වේ.

*සටහන* : මේ ඇමුණුමෙහි ලබා දී නොමැති විකිරණ නියුක්ලයිඩවලට D වටිනාකම එම දත්ත අවශ්‍ය පරිදි සහ අවශ්‍යවන විට දී සභාව විසින් තීරණය කරනු ලැබේ.

*ප්‍රභවයන්ගේ සමුච්චය*

නිෂ්පාදන ක්‍රියාවලියේ දී (උදා : එකම කාමරයේ හෝ ගොඩනැගිල්ලේ) හෝ ගබඩා කිරීමේ පහසුකම්වල දී (උදා: සමාන කුටිය තුළ) විකිරණශීලී ප්‍රභව කිහිපයක් ඉතා ආසන්නත ම වන අවස්ථා ඇත. එවැනි අවස්ථානුගත කරුණුවල දී, විකිරණශීලී නියුක්ලයිඩ එකක් පමණක් පවතින්නේ නම්, විකිරණශීලී ප්‍රභවවල සක්‍රියතා එකතුව විකිරණ නියුක්ලයිඩයේ අදාළ D වටිනාකමින් බෙදිය යුතු අතර අනුරූප සුරක්ෂිතතා මට්ටම් තීරණය කිරීම සඳහා ගණනය කරන ලද A/D අනුපාතය 2 වන වගුවේ දී ඇති A/D අනුපාත සමග සංසන්දනය කළ යුතු ය. විවිධ විකිරණ නියුක්ලයිඩ සමග විකිරණශීලී ප්‍රභව පවතින්නේ නම් එවිට වර්ගය තීරණය කිරීමේ දී, පහත දැක්වෙන සමීකරණය අනුව A/D අනුපාතවල එකතුව භාවිතා කරනු ලැබිය යුතු ය.

$$A/D \text{ එකතුව} = \sum_n \frac{\sum_1 A_{i,n}}{D_n}$$

මෙහි:

$A_{i,n}$ = n නම් විකිරණ නියුක්ලයිඩයේ එක් එක් i නම් තනි ප්‍රභවයේ සක්‍රියතාවය.

$D_n$ = n නම් විකිරණ නියුක්ලයිඩයේ D වටිනාකම

## II වන උපලේඛනය

(28 වන නියෝගය)

### සුරක්ෂිතතා සැලැස්මක අන්තර්ගත පිළිබඳ උදාහරණ

ප්‍රභවයක හෝ ප්‍රභවවල ආරක්ෂාව සඳහා භාවිත කරනු ලබන සුරක්ෂිතතා ප්‍රවේශය සහ පද්ධතිය විස්තර කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන සියළු තොරතුරු සුරක්ෂිතතා සැලැස්මක අන්තර්ගත විය යුතු ය. විස්තරවල සහ අන්තර්ගතයේ මට්ටම සැලැස්ම මගින් ආවරණය කරනු ලබන ප්‍රභවයේ හෝ ප්‍රභවවල සුරක්ෂිතතා මට්ටම් සමග සමාන විය යුතු ය. පහත දැක්වෙන මාතෘකා ආදර්ශ වශයෙන් ඇතුළත් කරනු ලැබිය යුතු ය ෑ

(අ) ප්‍රභවය පිළිබඳව විස්තරයක්, එහි වර්ගීකරණය සහ භාවිතය ;

(ආ) ප්‍රභව භාවිතා කරනු ලබන හෝ ගබඩා කරනු ලබන පරිසරය, ගොඩනැගිල්ල සහ/හෝ පහසුකම පිළිබඳව විස්තරයක් සහ අදාළවන්නේ නම්, පහසුකම් පිරිසැලැස්මේ සහ සුරක්ෂිතතා පද්ධතියේ දළ රූප සටහනක් ;

(ඇ) මහජනතාවට ප්‍රවේශ විය හැකි ප්‍රදේශවලට සම්බන්ධ ගොඩනැගිල්ල හෝ පහසුකම පිහිටි ස්ථානය ;

(ඈ) ස්ථානීය සුක්ෂිතතා කාර්යය පටිපාටිය ;

(ඉ) නිශ්චිත ගොඩනැගිල්ලක් හෝ පහසුකමක් සඳහා වන සුරක්ෂිතතා සැලැස්මක අරමුණුවලට පහත දැක්වෙන අරමුණු ඇතුළත් විය යුතු ය ෑ-

(i) ආමන්ත්‍රණය කළ යුතු නිශ්චිත කාරණයෘ නීති විරෝධී ඉවත් කිරීම, විනාශ කිරීම හෝ ද්වේශ සහගත භාවිතය ;

(ii) අවශ්‍ය කරන අමතර උපකරණ ද ඇතුළුව අනිටු ප්‍රතිඵල වැළැක්වීම සඳහා අවශ්‍ය වන පාලනයේ ස්වභාවය ; සහ

(iii) සුරක්ෂිතවන උපකරණ හෝ පරිශ්‍ර.

(ඊ) පහත දැක්වෙන පියවර ද ඇතුළුව භාවිත කරන සුරක්ෂිතතා පියවර ෑ

(i) සුරක්ෂිත කිරීම, සෝදිසි කිරීම සැපයීම, ප්‍රවේශය පාලනය කිරීමට සැලැස්වීම, සොයා ගැනීම, ප්‍රමාද කිරීම. ප්‍රතිචාර දැක්වීම සහ සන්නිවේදනය කිරීම සඳහා වන පියවර ; සහ

(ii) උපකල්පිත තර්ජනය සම්බන්ධයෙන් වන පියවරයන්ගේ ගුණාත්මකභාවය අගය කිරීම සඳහා නිර්මිත ලක්ෂණ.

(උ) පහත දැක්වෙන පියවර ද ඇතුළුව භාවිත කරනු ලබන පරිපාලන පියවර ෑ-

(i) කළමනාකරණයේ, කාර්යය මණ්ඩලයේ සහ වෙනත් තැනැත්තන්ගේ ආරක්ෂක කාර්ය භාරය සහ වගකීම් ;

(ii) ප්‍රභවයක් හෝ ප්‍රභව සඳහා ගිණුම්කරණය ඇතුළුව, එදිනෙදා සහ එදිනෙදා නොවන මෙහෙයුම් ;

(iii) උපකරණ නඩත්තුව සහ පරීක්ෂා කිරීම් ;

(iv) සේවක පිරිස්වල විශ්වසනීයභාවය තීරණය කිරීම ;

(v) තොරතුරු සුරක්ෂිතතාව භාවිතය ;

(vi) ප්‍රවේශ වීම සඳහා අධිකාරී බලය දීමේ ක්‍රමවේද ;

(vii) සිදුවීම් වාර්තා කිරීම් ඇතුළුව, හදිසි සැලසුමේ සුරක්ෂිතතාවය සහ සම්බන්ධිත පැතිකඩ ;

(viii) පුහුණු කිරීම ; සහ

(ix) යතුරු පාලනය කිරීමේ කාර්ය පටිපාටි.

(ඌ) තර්ජන මට්ටම වැඩිවීම් ආමන්ත්‍රණය කිරීම සඳහා වන කාර්ය පටිපාටි ;

(එ) කලින් කලට සැලැස්මේ සඵලදායී බව අගයීම සහ ඒ අනුව එය යාවත්කාලීනව කිරීම සඳහා වන ක්‍රියාවලිය ;

(ඒ) භාවිතයට ගනු ලැබිය හැකි යම් හානි පූරක පියවර ; සහ

(ඔ) පවත්නා නියෝග හෝ ප්‍රමිතීන් භාවිතය.

EOG 07 - 0008